**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2023**
**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව, දේපල අයිතමයක මුළු පිරිවැය හා සසඳන විට සැලකිය යුතු පිරිවැයකින් සමන්විත එම අයිතමයේ කොටස් සෑම එකක්ම වෙන් වෙන්ව හඳුනාගත යුතු වුවත් මුළු පිරිවැය රු.134,683,729 ක් වූ නිලාවේලී පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම, ඉඩම් හා ගොඩනැඟිලි වශයෙන් වෙන් වෙන්ව සමාලෝචිත වර්ෂයේදී හඳුනා ගෙන ගොඩනැඟිලි ක්ෂය වටිනාකම ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | තක්සේරු කිරීමෙන් අනතුරුව ගොඩනැගිලි ක්ෂය කිරීම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම් වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් යටතේ කාර්යාල උපකරණ ලෙස දිස්ත්‍රික්ක 13 කට අදාළව එකතු පිරිවැය රු. 1,248,798 ක හඳුනා නොගත් 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙනා ශේෂයක වත්කම් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී ද සාධාරණ අගයට | හඳුනා නොගත් ශේෂයන් වශයෙන් ඉදිරියට ගෙනවිත් ඇති ශේෂයන් නිවැරදිව හඳුනාගෙන සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | වත්කම් හඳුනාගෙන සාධාරණ අගයකට ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත කර නොතිබුණි. එහි ශුද්ධ උපලබ්ධි වටිනාකම රු. 76,195 ක් වි තිබුණි. | | |
| (ආ)) | අරමුදලට අදාලව ඇති වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 78,542,085 ක් වූ අරමුදල සතු වත්කම් (නීලාවේලි හැර) සන්නිරීක්ෂණය කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද නොහැකි විය. | සමාජ ආරක්ෂණ අරමුදලට අයත් වත්කම් භාණ්ඩ සමීක්ෂණ කටයුතු දැනට සිදු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසු එම වාර්තා විගණන කටයුතු සඳහා ඉදිරිපත් කරන බව. | අරමුදලට අදාලව ඇති වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කල යුතුයි. |
| (ඇ) | 2021 අප්‍රේල් 6 දින සමෘද්ධි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබූ ජංගම වායුසමීකරණ යන්ත්‍ර 2 හි වටිනාකම ගණනය කර සමාලෝචිත වර්ෂයේදී ද ගිණුම්ගත කර නොතිබුණි. මෙම උපකරණ 2023 වර්ෂයේ සමීක්ෂණ වාර්තාව මඟින්ද තහවුරු කර නොතිබුණි. | මෙම ජංගම වායු සමීකරණ යන්ත්‍ර දෙක නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි ඇතුලත් කර ඇති අතර ඉදිරියේ දී එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | පෙර වර්ෂයන් සඳහා ගෙවන ලද රු. 941,280 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂ සඳහා විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2023 වර්ෂය ආරම්භයේ උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබූ බව හා 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ඇති බව. | වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුයි. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී සහනාධාර නව නිකුත් කිරීම් ලෙස දිස්ත්‍රික්ක 6 ක් සඳහා ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.8,567,239 ක මුදලක් සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත දිස්ත්‍රික්ක කාර්යාල විසින් ලබා දී තිබුණද දෙපාර්තමේන්තුවෙන් 2023 දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල අරමුදලට ලබා දී නොතිබුණි. දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේද මෙම මුදල දක්වා නොතිබුණි. | මෙම මුදල් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මුදල් අංශයෙන් ලබාදුන් වාර්තාව භාරකාර මණ්ඩල උපදෙස් පරිදි පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබාදෙන ලෙසට අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කර ඇති බව. | අරමුදලට ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 381(1) | 2017 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වාම භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනිමට අදාල ලිපි ලේඛන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා ප්‍රධාන ගණකාධිකාරි වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරිමට කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1)(ඇ) | ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය සකස් කොට පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 ට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයට අදාල අයවැය ලේඛණ සකස් කර, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඈ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය II කොටසේ 9 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 880 | පුහුණු මධ්‍යස්ථානයේ චෙක්පත් සහ මූල්‍ය පාලනය සිදුකරන සමෘද්ධි කළමනාකරු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. | චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරින් ඇප මුදල් තැන්පත් කිරිමට අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877 (2) (ඇ) | අරමුදල සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදලේ කාර්ය සාධන වාර්තාව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ඉදිරිපත් කරන බැවින් මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීම අවශ්‍ය නැති බව. | චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල සඳහා වෙනම කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,329,823,802 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,328,591,826 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,001,231,976 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී අළුතෙන් ලක්ෂ 6 කට සමෘද්ධි සහනාධාර ලබාදීම සඳහා ඔවුන් සවිබලගැන්වීම සඳහා අපනයන ගම්මාන 5,000 ක් පිහිටුවීම හා එමගින් වසරකට ඩොලර් මිලියනයක් උපයන ආර්ථික ඒකකයක් දක්වා දියුණු කිරිමේ අරමුණෙන් හිමිකම් ප්‍රදානය සඳහා දිවයින පුරා සමාරම්භක වැඩ සටහන් පැවැත්වීම, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරිම් සිදුකිරිම සඳහා වැඩසටහන් 350 ක් ක්‍රියාත්මක කිරීමට සමාජ ආරක්ෂණ අරමුදලින් රු. 144,733,844 ක් වැයකර තිබුණි. මේ සඳහා සමෘද්ධිලාභින්ගේ සහනාධාර මුදලින් රු. 500 බැගින් 2023 දෙසැම්බර් 31 දින දක්වා රු. 143,075,654 ක් ප්‍රතිලාභින්ගෙන් අයකර තිබුණි. මෙම වටිනාකමෙන් රු. 96,612,500 ක් 2023 පෙබරවාරි මස සමෘද්ධි සහනාධාර මුදලින් සෘජුවම අයකර තිබුණි. නමුත් ඉහත අරමුණු කරා ලගා වී නොතිබීම හේතුවෙන් අරමුදලෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | නව සමෘද්ධි සහනාධාර ලබා දීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදලින් වැය කරන ලද රු.144,731,154 ක මුදලින් 2024.04.01 දින වන විට තවදුරටත් අය විය යුතු මුදල රු. 1,002,690 ක් බව. | ප්‍රතිලාභීන්ගේ දායක මුදල් ඵලදායි ලෙස අදාළ අරමුණු වෙනුවෙන් යෙදීය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු භූමි ප්‍රමාණය අක්කර 7 රූඩ් 3 පර්චස් 28 කි. දිනකට රු. 2000 බැගින් වූ දෛනික වැටුප් ගෙවීමේ පදනම මත කම්කරුවන් දෙදෙනෙක් සේවයේ යොදවා ඇති අතර ඔවුන් සඳහා ගෙවන වාර්ෂික කුලිය රු. 1,596,400 ක් වේ. 2023 වර්ෂයේ වගා ආදායම (අඹ) රු. 7000 ක් පමණි. මධ්‍යස්ථානය විසින් කෘෂිකර්ම උපදේශකවරයාගේ උපදෙස් ලබාගැනීමකින් තොරව රු. 75,055 ට මිලදී ගෙන සිටුවා ඇතැයි සඳහන් කෙටිකාලීන බෝග වගාවන් විනාශ වී තිබුණි. ගෙවා ඇති කම්කරු වැටුප හා භූමි ප්‍රමාණයට සාපේක්ෂව වගා ආදායම ලබා ගැනීමට භූමිය වගාවන් සඳහා ඵලදායීව යොදවා නොතිබුණි. | කෘෂිකර්ම උපදේශකවරයකුගේ සහ පොල් සංවර්ධන නිලධාරිවරයකුගේ සහාය ලබාගෙන දිගු කාලීන හා කෙටිකාලීන බෝග වගාවක් 2022 වර්ෂයේ සිදු කර ඇතත් මෙය කලපුව ආශ්‍රිත භූමියක් බැවින් කෙටිකාලීන බෝග වගාවන් පාරිසරික තත්වයන් සුදුසු නොවන බව අනාවරණය වූ බව හා ස්වාභාවික හේතූන් මත හා සතුන්ගෙන් සිදු වූ විනාශයන් හැරුණු විට දිගුකාලීන බෝග සක්‍රියව පවතින බව. | භූමිය ඵලදායීව යොදවා ගත යුතුයි. |

## 3.3. මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සමෘද්ධි සමාජ සංවර්ධන භාර අරමුදලේ භාර ඔප්පුවේ (සාධන පත්‍ර අංක 08) 6 (9) ඡේදයට අනුකූල නොවන ලෙස භාරකාර මණ්ඩල සභාපති වශයෙන් කටයුතු කරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාරකාර මණ්ඩල රැස්වීම් සඳහා ලබා ගන්නා දීමනාවට අමතරව 2020 පෙබරවාරි සිට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් දක්වා රු. 984,323 ක් එනම් දෙපාර්තමේන්තුවේ නිත්‍ය තනතුරෙහි මූලික වැටුපෙන් ¼ ක් රාජකාරි ඉටු කිරිම වෙනුවෙන් වැඩ බැලීමේ දීමනා ලබාගෙන තිබූ අතර වර්තමාන සභාපතිවරයාද 2023 නොවැම්බර් සිට දෙසැම්බර් මස දක්වා එකතුව රු. 53,887 ක් ඉහත පරිදි වැඩ බැලීමේ දීමනා ලබා ගෙන තිබුණි. | මෙම දීමනා ගෙවීමට අදාලව ඉදිරියේ දී ඇති වන අවශ්‍යතාවයන් අනුව අවස්ථානුකූලව භාරකාර ඔප්පුව සඳහා සිදු කල යුතු සංශෝධන එකතු කිරිමට භාරකාර මණ්ඩල උපදෙස් පරිදි සිදු කිරීමට නියමිත බව. | අරමුදලේ භාර ඔප්පුව අනුව වැඩබැලීමේ දීමනාවක් නොගෙවිය යුතු අතර ඊට අනුකූල නොවන ලෙස මුදල් අයකල යුතුය. |

### 3.4 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානයේ ඇති බවුසර් රථය පරිහරණය කර නියං කාලයේදී මහජනතාවට අවශ්‍ය ජලය බෙදාහැරීමේ සේවාවන් ලබාදීමට සහ වෙනත් ආයතනවලට කුලියට ලබාදී ආදායම් ඉපැයීමේ හැකියාවක් පැවැති නමුත් 2019 වර්ෂයේ සිට වර්ෂ 04ක සිට එම රථය භාවිතා කර ආදායම් උපයා ගැනිමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර එම රථය අනාරක්ෂිත ලෙස මධ්‍යස්ථාන පරිශ්‍රයේ නවතා තබා තිබුණි. | මෙවැනි වාහන ප්‍රයෝජනයට ගැනිමට හා අවශ්‍යතාවයක් ඇති රජයේ ආයතන වෙත ලබාදීමට විමසීම් කර ඇතත් ඒ සඳහා ඉල්ලීම් නොලද බව හා මේ පිළිබඳ සොයා බලා කඩිනමින් තීරණයක් ගැනීමට කටයුතු කරන බව. | වත්කම් ඵලදායි ලෙස යොදාගැනීමට කටයුතු කල යුතුයි. |